# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.11 පැය 2245 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/712 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2025.04.11 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 750 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 53 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වෙන්නප්පුව පොලිස් ස්ථානය.**

2025.04.11 වන දින සවස් කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ දංකොටුව බෝලවත්ත මාගර්යේ ෆ්‍රැන්සිස්කෝ හන්දියේදී වෙන්නප්පුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 19 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන යතුරුපැදියකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අදාල යතුරුපැදිය සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන සිංගක්කුලිය, යෝගියාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අරලගංවිල පොලිස් ස්ථානය.**

2025.04.11 වන දින උදෑසන කාලයේ අරලගංවිල පොලිස් වසමේ ගල්තලාව ප්‍රදේශයේදී අරලගංවිල පොලිස් ස්ථනයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සහ මෙරට නිෂ්පාදිත ගිනි අවි 03 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 44 සහ 55 වයස්වල පසුවන දේවගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. හදිසි මරණයක් - බුත්තල පොලිස් වසම.

2025.04.11 වන දින සවස් කාලයේ බුත්තල පොලිස් වසමේ මහගොඩයාය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු නිවසක් තුල මියගොස් සිටින බවට ලද පණිවිඩයක් මත බුත්තල පොලිස් ස්ථානය විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ මහගොඩයාය, බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරිරය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත. බුත්තල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - කෝප්පායි පොලිස් වසම.

2025.04.11 වන දින සවස් කාලයේ කෝප්පායි පොලිස් වසමේ යාපනය පාලාලි මාගර්යේ තිරුනෙල්වේලි ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබාගත් ටිපර් රථයක් යාපනය දෙසට ගමන් කිරීමට ප්‍රධාන මාගර්යට ඇතුල් කරන අවස්ථාවේදී මාගර්යේ ගමන් කල පදික කාන්තාවක් ටිපර් රථයේ ගැටී එහි වම් පස පිටුපස රෝදයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 85 ක් වූ තිරුනෙල්වේලි උතුර, තිරුනෙල්වේලි ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කෝප්පායි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**